**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය - 2023**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ("නියෝජ්‍යායතනය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජ්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජ්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජ්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන පනත** | | | |
| **(i)** | 3 හි (ඇ) වගන්තිය | ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදකයන් හා මූලාරම්භකයන් සම්බන්ධ කිරීම නියෝජ්‍යායතනයේ අරමුණක් වුවද 2023 වර්ෂයේදී නියෝජ්‍යායතනය විසින් පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ එක්ව වැඩසටහන් 2ක් පමණක් සාර්ථකව සම්පූර්ණව සම්බන්ධීකරණය කර තිබීම හේතුවෙන් මෙම අරමුණු ප්‍රමාණාත්මකව ඉටු කර නොතිබුණි. | නව්‍යකරණයන් හා මූලාරම්භයන් සම්බන්ධ කිරීම සඳහා අප ආයතනය 2023 වර්ෂයේ දී පවත්වාගෙන ගිය වැඩසටහන් සංඛ්‍යාව ඊට වැඩිය. මෙම කාර්යයේ දී සාකච්ඡා වට ගණනාවක් පැවැත්වීමට ද සිදු වේ. නව්‍යකරණයන් හා මූලාරම්භයන් සම්බන්ධ කිරීම සඳහා, අදාළ පාර්ශවයන් උනන්දු වුවත් එය කෙටි කාලයකින් සාක්ෂාත් කර ගැනීම අපහසු අතර, NIA කාර්යය මණ්ඩලය මේ වෙනුවෙන් බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කරනු ලබයි. | පනතේ සඳහන් අරමුණු කාර්යක්ෂමව සහ සඵලදායීව ඉටුකරගැනීම සඳහා උපකාරීවන පරිදි සැලසුම් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතු බව |
| **(ii)** | පනතේ 4 හි (ඊ) වගන්තිය | නවෝත්පාදන කටයුතුවල නිමැවුම් වානිජකරණය කිරීම සඳහා නවෝත්පාදනයේ ජාත්‍යන්තර කටයුතු අදාළ | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පැවැත්වූ අතර | පනතේ සඳහන් අරමුණු කාර්යක්ෂමව සහ සඵලදායීව |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ දෙපාර්තමේන්තු නවෝත්පාදන ආයතන සමඟ සම්බන්ධ වී සිදුකළ යුතු වුවත් ඒ ආකාරයෙන් කටයුතු කර නොතිබුණි. | එම නිෂ්පාදනයක් සඳහා විදේශ ව්‍යවසායකයන් සමග සාකච්ඡා පැවැත්විණි. නමුත් නව්‍යකරුවන් සිය නව්‍යකරණ විදේශ රටවල නිෂ්පාදනය කිරීමට මැළි බවක් දැක්වීමත්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආරම්භය හා පවත්වාගෙන යාම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීමත් හේතුවෙන් එම උත්සාහයන් අසාර්ථක විය. | ඉටුකරගැනීම සඳහා උපකාරීවන පරිදි සැලසුම් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතු බව |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,347,843 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,598,340 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,946,183 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුද්ගල පඩිනඩි ගොඩනැගිලි කුලී වියදම් හා සැපයුම් හා පාරිභෝජනයන් පිළිවෙලින් රු.3,310,605, රු.3,182,256 හා රු.978,735 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ හා තාක්ෂණ හුවමාරුව මඟින් බිහිවන උසස් තාක්ෂණ ව්‍යවසායන් සඳහා පහසුකම් සැලැස්වීම තුළින් ජාතික නවෝත්පාදන ව්‍යවසායකත්ව උපායමාර්ග අරමුණුවලට සහය ලබාදීම නියෝජ්‍යායතනයේ කර්තව්‍යක් වුවත්, 2023 වර්ෂයේදී සාර්ථකව නිම කිරීමට හැකිව තිබුණේ තාක්ෂණ පැවරීම් දෙකක් පමණි. තවද නියෝජ්‍යායතනය විසින් පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් රු.665,890 ක් වැය කර වෙබ් පිටුවක් නිර්මාණය කර ආයතන දෙකක පමණක් නවෝත්පාදන දත්ත එයට ඇතුළත් කර තිබුණි. | ආයතනය විසින් B2P Platform අථත්‍ය වේදිකාව නිර්මාණය කළ අතර ඊට දත්ත ඇතුළු කිරීම කළ යුත්තේ විවිධ පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල හෝ පුද්ගලික මට්ටමේ නව්‍යකාරකයන් හා පර්යේෂකයන් විසිනි. ආයතනයේ කාර්ය භාරය වනුයේ එම දත්ත පරීක්ෂා කර මෙම වේදිකාවේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු තාක්ෂණ සූදානම් මට්ටමක (Technology Readiness Level) පවතීද යන්න විමසා බලා ඒවා ප්‍රදර්ශනය කිරීම සඳහා අනුමත කිරීම හා ඒ අනුව පහසුකම් සැලැස්වීමය. දත්ත ඇතුළු කිරීම ආයතනයේ කාර්යභාරය නොවන අතර එය ප්‍රායෝගික ද නැත. මේ වන විට වානිජකරණයට සූදානම් සිය නව්‍යකරණයන් මෙම B2P Platform අථත්‍ය වේදිකාව වෙත එවන මෙන් සියලු පර්යේෂණ ආයතන, | ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විශ්වවිද්‍යාල හා නව නිපැයුම් කරුවන් මෙන්ම පර්යේෂකයන් වෙතින් ඉල්ලමින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ, වැඩමුළු මෙන් ම රැස්වීම් හා සාකච්ඡා පවත්වනු ලැබේ. | |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ආයතනයේ අනුමත කාර්ය පටිපාටිය ප්‍රකාරව පත්වීම් දිනයේ සිට වර්ෂ 03ක කාලයක් තුළ කාර්යක්ෂමතා කඩඉම් තරඟවලින් සමත් විය යුතු වුවත්, විගණිත දින වන 2024 ජනවාරි 05 දින වන විට නිළධාරීන් 11 ක් සඳහා පත්වීම් ලබා දී වර්ෂ දෙකක් ගත වී තිබුණද කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා නොතිබුණ අතර ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් සිදුකර නොතිබුණි. | නිලධාරීන් 04 දෙනෙකුහට 2025 ජනවාරි 01 දිනට පෙර කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට කටයුතු යොදන අතර ඉදිරියේදී ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු නොපමාව සිදුකරමි. | නියමිත කලට කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට කටයුතු කළ යුතුය. |